# රිදී මාලුවා
# සහ
# පුංචි ළමයා




R.B. විශ්මි ආකර්ශා

# රිදී මාළුවා සහ පුංචි ළමයා

R.B. විශ්මි ආකර්ෂා

මහ/මහමායා බාලිකා විදුහල

කතාව සහ චිත්‍ර

R.B. විශ්මි ආකර්ෂා

5 ශ්‍රේණිය E

**ISBN 978-624-208-973-7**

කෘතිය පළ කරන දින

2026-05-10

කතෘ ප්‍රකාශනයකි

2026

# පිදුම

සිප් සතර කියාදුන්
තිලකරත්න
ගුරු පියාණන්ටත්
සියලුම
ගුරු මෑණිවරුන්ටත්
ගුරු පියවරුන්ටත්
මාගේ යෙහෙළියන්ටත්
මෙම ග්‍රන්ථය
ඉතා
ආදරයෙන් , ගෞරවයෙන්
පුද කරමි....!!



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා නවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ ද දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගීත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

**පුං**චි ගඟක් තිබුණා. ඒ ගඟේ ලස්සන මාළුවෙක් හිටියා. ගමේ හැමෝම ඒ මාළුවට කිව්වේ රිදී මාළුවා කියලා.



එක් දිනක් රිදී මාළුවා එහා මෙහා පීන පීන ඉන්න විට ගඟ ළඟට පුංචි ළමයෙක් ආවා.



ඒ ගැණු ළමයා නිතරම ගඟ ළඟට ආවා පීනන්න. ළමයාව දුටුව මාළුවා එක් විටම වතුරෙන් ඉහළට පිනුමක් ගැහුවා.

ඒ වෙලාවෙ පුංචි ගැනු ළමයා රිදී මාළුවා දුටුවා.

මාළුවා ඉහළට පැන  නැවත ගඟ පතුලට පීනන්න පටන් ගත්තා.මාලු යාලුවේ ඔයා කොහේද ?

පුංචි ගැනු ළමයා කතා කළා.




එකපාරටම වතුරෙන් උඩට මාළුවා ආවා. පුංචි ගෑණු ළමයට ගොඩක් සතුටු හිතුණා. මාළුවා එකපාරටම ගෑණු ළමයාගෙන් ඇහුවා නෙළුම් මල් වලට කැමතිද කියලා. ගෑණු ළමයා පුදුම වුණා. මාළුවට කතා කරන්න පුළුවන්. ඔව් යාළුවේ ඔයාට මාව ඇහෙනවද ? ඔව් මාළු යාළුවේ.

මම ගොඩක් දුකෙන් ඉන්නේ. රිදී මාළුව පුංචි ගෑණු ළමයට කිවුවා. ඇයි යාළුවේ දුකෙන් ඉන්නේ ? මිනිස්සු කට්ටියක් ඇවිත් මගේ අම්මව අරගෙන ගියා. අනේ යාළුවේ මට උදව් කරන්න. අම්මව හොයාගන්න. රිදී මාළුවා පුංචි ගෑණු ළමයට කිවුවා.

රිදී මාළුවගේ කතාව ඇසූ ගැණු ළමයා හනික නිවසට දිව ගොස් සිදු වූ සියල්ල අම්මාට, තාත්තාට කිව්වා.



පුංචි ළමයයි,අම්මයි,තාත්තයි ගඟ ළඟට ගියා. රිදී මාළුවාට කතා කරා. ඒත් මාළුවා වෙරළට ආවේ නෑ. අම්මා දැක්කා ඈතින් වාහනයක මාළුවා අරගෙන යනවා. මහත්තයෝ, දුවේ අම්මා කෑ ගහන්න පටන් ගත්තා. තාත්තටයි දුවටයි දුටුව දේ කිවුවා. ඉක්මනටම අපි යමු.  පුංචි ළමයත්, තාත්තත්,අම්මත් කාරයේ නැග වාහනය පසුපස ලුහු බැන්දා.



වාහනය එකවරම නතර කළා. පුංචි ළමයයි අම්මයි, තාත්තයි කාරය නවතා එතැනට දිව ගියා. රිදී මාළුවා පුංචි ළමයා දුටුවා. යාළුවේ!! යාලුවේ!! මාව බේරගන්න!!! රිදී මාළුවා කිව්වා.

පුංචි ළමයා මාළුවා රැගෙන ආ මිනිසුන් ළඟට ගොස් අඬන්න පටන් ගත්තා. මාමේ මාමේ මගේ යාළුවාව අත හරින්න එයාගේ අම්මත් නැතිව ගොඩක් දුකින් ඉන්නේ පුංචි ළමයා කිව්වා. අනේ මාමේ පුළුවන්නම් රිදී මාළු වගේ අම්මව සොයා දෙන්න.

අඬන්න එපා පුංචි ළමයෝ අපි ළඟ රිදී

මාළුවගේ අම්මා ඉන්නවා. අපි රිදී මාළුවයි,

අම්මයි දෙන්නම ගඟට ගිහින් අත්හරිමු.

බොහොම ස්තූතියි මාමේ,  පුංචි ළමයා,

අම්මා, තාත්තා හැමෝම ගඟ ළඟට ගියා.රිදී

මාළුවයි අම්මයි ගඟට දැම්මා. රිදී මාළුවයි

අම්මයි බොහෝම සතුටින් එහා මෙහා

පීනනවා. එය දුටු හැමෝම සතුටින් හිනා

වුණා. රිදී මාළුවා පුංචි ළමයාට සිදු වූ

සියල්ලට ස්තූති කලා.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දූරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN 978-624-208-973-7**